# අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි භෞතික සාධක වල බලපෑම

ඩබ්. එච්. ශානිකා ප්‍රියදර්ශනී [1]

**සංක්ෂේපය**

අධ්‍යාපනය ලැබීම මූලික මිනිස් අයිතිවාසිකමක් වන අතර ඒ සඳහා විවිධ ආයතන ද පිහිටුවා තිබේ. ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකාවේ පාසල්, අධ්‍යාපනය ලබා දීමේ කාර්යයේ ප්‍රමුඛ ස්ථානයක පවතියි. නාගරික පාසල් මෙන්ම ග්‍රාමීය පාසල් ද අධ්‍යාපනය ලබා දීමේ කාර්යයේ නිරත වන අතර එම පාසැල් වල පවත්නා භෞතික සම්පත්, අධ්‍යාපනය සාර්ථක ලෙස ලබා දී සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය ඉහළ නැංවීමට දරන දායකත්වය ඉතා වැදගත් වේ. ඒ අනුව, එම පාසැල් වල පවත්නා භෞතික සාධක සිසුන්ගේ කාර්ය සාධනය කෙරෙහි බලපෑමක් සිදු කරනවා ද යන්න සොයා බැලීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. මේ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාමීය පාසැල් හා නාගරික පාසැල් වල අධ්‍යාපනය ලබන සිසුන්ගෙන් සසම්භාවී ලෙස තෝරාගත් සිසුන් 50 කින් යුත් නියැදියකට ප්‍රශ්නාවලියක් ලබා දීම මගින් මෙම තොරතුරු රැස් කරන ලදී. මෙම පර්යේෂණයේ දී අවධානය යොමු වුණ කරුණක් වන්නේ, පාසල් වල පවතින භෞතික සාධක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි යම් කිසි බලපෑමක් සිදු කරනවාද යන්නයි. එහිදී විශේෂයෙන්ම පාසල් වල පවතින භෞතික පහසුකම් අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි බලපාන බව විශ්ලේෂණයේදී අනාවරණය විය. ඒ අනුව, පරිගණක මධ්‍යස්ථාන පවතින පාසල් 66% ක් පවතින අතර එම පාසල් වල සිසුන්ගේ තාක්ෂණ දැනුම ඉහළ බවත් එම පහසුකම් නැති සිසුන්ගේ තාක්ෂණ දැනුම අවම බවත් අනාවරණය විය. පර්යේෂණ නියැදිය තුළ 100%ක්ම පුස්තකාල පහසුකම් පැවතියද එයින් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේ, 76%ක් පමණ වන නිසා සිසුන්ගේ කාර්ය සාධනයද එයට සාපේක්ෂව පවතියි. සෑම පාසලකටම පර්යේෂණාගාරයක් නොමැති බව මෙහිදී අනාවරණය වු අතර 88%කට පර්යේෂණාගාරයක් හිමි වුවද එයින් 38%කට අවම පහසුකම්ද, 36% කට සාමාන්‍ය පහසුකම්ද, 14% ඉහළ පහසුකම්ද පවතින අතර එම පාසල් වල සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය ඉහළ මට්ටමක පවතින බව ද අනාවරණය විය. මේ අනුව මෙම පර්යේෂණයේදී භෞතික සාධක අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි බලපෑමක් පවතින බව අනාවරණය විය. මේ අනුව ග්‍රාමීය හෝ නාගරික පාසැල් වල සිසුන්ගේ න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම වර්ධනය කරමින් අධ්‍යාපන කාර්ය සාධනය උපරිම කිරීම සඳහා භෞතික සාධක වල අවශ්‍යතාව අනිවාර්ය බව නිගමනය වූ අතර කාර්ය සාධනය උපරිම සිසු පරපුරක් බිහි කිරීම සඳහා රජයේ අවධානය යොමු විය යුතුය.

**මුඛ්‍ය පද :** අධ්‍යාපන, කාර්ය සාධනය, භෞතික සාධක, ප්‍රායෝගික, න්‍යායාත්මක

[1]ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
shanikapriyadarshaniwalpola@gmail.com